

ජගත් ජේ එදිරිසිංහ ලියන

# තාරකා විජිතය

8

නිෂාධිගේ ගුවන් ටිකට් පත සකස් කර ගන්නට දිලීපට දින දෙකක් ගත විය. අනුරත් පවිත්‍රාත් කොයි තරම් පෙරැත්ත කළ ද ඉක්මනින් ආපසු යාමේ තීරණය වෙනස් කරන්නට දිලීප නොසිතුවේ ය. ඔහු තම මතයේම දැඩි ලෙස එල්බ ගෙන සිටියේ ය.

නිෂාධි බලන්නට අනුරාධ වරින් වර පැමිණියේ ය යන කරුණ දිලීප ට රහසක් නොවී ය. ඒ ගැන නිෂාධිගෙන් විමසන්නට තරම් කලබල වන්නට ඔහු නොසිතුවේ ය. අනුරාධ හා නිෂාධි අතර සාමාන්‍ය හිතවත් කමකින් ඔබ්බට ගිය බැඳීමක් ඇතැයි සිතන්නට හෝ හැකියාවක් ඔහුට නොවී ය. එසේ නොවේ නම් එවැනි බැඳීමක් ඇති වන්නට ඉඩක් නැතැයි කියා සිත රවටාගෙන සිටින්නට ඔහු වඩාත් කැමැති විය.

සියල්ලට ඇති එකම සහ ඉක්මන් විසඳුම ලෙස ඔහු දුටුවේ හැකි ඉක්මණින් ලංකාවෙන් පිටමං වීම ය. මේ රට තුළ නැති විශාල ශක්තියක් ඔස්ට්‍රේලියාවේ දී තමාට ඇතැයි ඔහුට දැනෙයි. තමාට නොගැලපෙන තමා ආගන්තුකයෙකුව සිටින මේ රටෙන් හැකි තරම් ඉක්මනින් පිටව යා යුතු ය.

''අපි සෙනසුරාදා ආපහු යනවා.. මම ටිකට්ස් බුක් කළා'' නිෂාධි බලන්නට රෝහලට ආ මොහොතක දිලීප අනුරට හා පවිත්‍රාට කීවේ ය. එය නිෂාධිට ද අලුත් ආරංචියක් විය.

''ඇයි එච්චර ඉක්මනට ...? තව දවස් තුනයි නෙ...'' පවිත්‍රා විමතියෙන් මෙන් ඇසුවා ය.
''ඔව්..'' දිලීප කිවේ නොසැළකිලිමත් ලෙස ය.
''මට එච්චර ඉක්මනට යන්න බැහැ..'' නිෂාදි මුරණ්ඩු ලෙස කීවා ය.

''මම ඩොක්ටර් එක්ක කතා කළා.. අද හවසට නිෂාධිගෙ ටිකට් කපයි..'' දිලීප නිෂාධි කී දේ නෑසුණා සේ අනුර දෙසට හැරී කිවේ ය. ''දැන් බයවෙන්න දෙයක් නැහැ... මම ඔක්කොම ඇඩ්වයිසස් අරගත්තා.. කොහොමත් මෙහාට වැඩියෙන් හොඳ පහසුකම් එහේ තියෙනවා..''

''මට යන්න බැහැ...'' නිෂාධි නැවත දැඩි ව කීවා ය.
දිලීප ඇය දෙස හැරී බැලුවේ ය. පළමු වතාවට ඔහුගේ දෑස් කෝපයෙන් කුඩා වී යනු නිෂාධි දුටුවා ය. ඇය එයින් බියට පත් වූයේ නැත. තව දුරටත් දිලීපට තමාගේ ජීවිතයේ ඉඩක් නැති බව නියත වශයෙන්ම පසක් කර ගෙන සිටි බැවින් නිෂාධි නොසැළුණා ය.

''දිලීපට ඕනෙ නම් යන්න.. මම එන්නෙ නැහැ..'' නිෂාධි මුරණ්ඩු ලෙස කීවා ය.

''අපට යන්ඩම වෙනවා නිෂාධි..'' ඔහු ගේ කටහඬ කෝපය නිසා වෙව්ළණු ඇයට දැනුණි.

නිෂාධි යමක් කියන්නට පෙර ම දිලීප කාමරයෙන් පිටවූයේ ය. අනුර ඔහු පසුපසින් ගියේ දිලීප සන්සුන් කරන්නට සිතාගෙන ය.

පවිත්‍රා නිෂාධිගේ හිස අද්දරින් ඇඳෙහි වාඩි වූවා ය. නිෂාධි ඇගේ උරහිසට හිස තබා ගත්තා ය. නිෂාධි ගේ දෑස් කඳුලින් පිරී තිබුණි. ඇය සුසුම් හෙළණු පවිත්‍රාට දැනුණි.

''උඹ දුක් වෙන්න එපා..'' පවිත්‍රා කීවේ යමක් කිව යුතුම නිසා ය.

''මට.. යන්න.. බැහැ..'' නිෂාධි කෙඳිරුවා ය.
''මට තේරෙනවා බං.. ඒත් ඉතින් ඒ මිනිහා යන්නම කතා කරනවා නම් උඹට යන්නම වෙනවා නේද..?''

නිෂාධි හීල්ලුවා ය. ඇය යමක් කියා ගන්නට නොහැකිව තතනන බව පවිත්‍රා තේරුම් ගත්තා ය. ඇයට කියන්නට අවශ්‍යව ඇත්තේ කුමක්දැයි පවිත්‍රා ඉවෙන් මෙන් වටහා ගත්තා ය.

''මම අනුරාධට කියන්නම්...'' පවිත්‍රා බොහෝ වේලාවකට පසුව කීවා ය. නිෂාධි ඇගේ අතින් අල්ලා ගත්තා ය. බොහෝ ආදරයෙන් ඇගේ අත මිරිකා ගත්තා ය.

''අනේ අදම.. අදම කියනව ද..?''
''හොඳයි.. උඹ දුක් වෙන්න එපා.. මං අදම කියන්නං..'' පවිත්‍රා පොරොන්දු වූවා ය.

''මං.. මං.. මොකද දැන් කරන්නෙ පවි..''

''උඹට මොකක් කියන්නද කියලා මට තේරෙන්නෙ නැහැ නිෂා... මට තේරෙනවා උඹේ හිතේ තියෙන දේ ඔක්කොම.. ඒත් දැන් මේ හදිසියේ උඹට යමක් කරන්න පුලුවන් වෙයි කියලා මට හිතෙන්නෙ නෑ.. මං දන්නවා.. මං දන්නවා මේ ටික දවසට උඹ අනුරාධට බැඳුණු විත්තිය.. මට තේරෙනවා මට දැනෙනවා ඒක බොහොම ලොකු බැඳීමක් බව.. ඒත් උඹ මේ හදිසියේ මොනවා කරන්න ද?''

''අනේ පවී..'' නිෂාධි ඉකි බින්දා ය.

''උඹ මේ සැරේට දිලීප එක්ක පලයං.. ගිහින් බලපං මේ දේවල් වෙනස් වෙයිද කියලා.. සමහර විට ගියාට පස්සෙ මේ පරිසරයෙන් ඈත් වුණාට පස්සෙ උඹේ හිත

පවිත්‍රාගේ දුරකතන ඇමතුම ලැබන විටත් අනුරාධ සිටියේ නිෂාධි බලන්නට රෝහලට යන්නට සූදානම් වෙමිනි. පවිත්‍රා ගෙන ආ ආරංචියෙන් ඔහු මහත් කම්පනයට පත්වූයේ ය.

වුණත් වෙනස් වෙන්න ඉඩ තියෙනවා.. කාලයට ඉඩ දීලා බලපං..''

''මං වෙනස් වෙන්නෙ නෑ... එහෙම වෙනස් වෙන්න මට බෑ.. මං ගැන එහෙම අඩු තක්සේරුවකින් බලන්න එපා..'' නිෂාධි දැඩිව කීවා ය.

''වෙනස් වෙන්නැත්නං හොඳයි.. එහෙමනං ගිහින් පිළිවෙලකට ඉතිරි වැඩ ටිකත් කරගනින්.. කලබල වෙන්න එපා.. කල්පනාවෙන් වැඩ කරපං.. මං මට කරන්න පුලුවන් උදව්වක් කරන්නං.. මෝල්ගහක් වගේ ගල් වෙච්ච මිනිහෙකුට උඹ වගේ කෙල්ලෙක් ගැලපෙන්නෙ නැහැ.. උඹ හරි යන්නෙ උඹට තියෙනවා වගේ සුන්දර හදවතක් තියෙන මිනිහෙකුට... කවියක් වගේ සුන්දර මිනිහෙකුට.. ඒක තමයි ඇත්ත.. සම්මතයට හෙණ ගැහිච්චාවෙ.. මං උඹට උදව් කරන්නං''

000000

පවිත්‍රාගේ දුරකතන ඇමතුම ලැබන විටත් අනුරාධ සිටියේ නිෂාධි බලන්නට රෝහලට යන්නට සූදානම් වෙමිනි. පවිත්‍රා ගෙන ආ ආරංචියෙන් ඔහු මහත් කම්පනයට පත්වූයේ ය. මේ තරම් ඉක්මනින් නිෂාධිගෙන් ඈත් වන්නට සිදු වෙතැයි ඔහු සිහිනයෙන් වත් නොසිතුවේ ය.

දින දෙකක් යනු ඉතා කෙටි කාලයකි. මේ කෙටි කාලය තුළ නිෂාධි තමා වෙතට ගන්නට නොහැකි බව අනුරාධ දනියි. එය බැරෑරුම් කාර්යයකි. සෙල්ලමකට කළ නොහැකි ය. සම්පූර්ණ කරගත යුතු දේ බොහෝ ය. සියල්ල ප්‍රවේශමෙන් සැළසුම් කළ යුතු ය.

තනිකඩයකු ලෙස ගෙවූ දිවිය තුළ අනුරාධ තමාට යයි කියා කිසිවක් රැස් කරගත්තේ නැත. ඒ එසේ කරන්නට අවශ්‍යතාවක් නොවූ නිසා ය. ගෙයක් දොරක් තනාගන්නට අදහසක් වත් මේ තාක් කාලයක් ඔහුට ඇති නොවී ය. ජීවිතය පිළිබඳව වඩාත් බැරෑරුම් ලෙස හිතන්නට දැන් කාලය එළැඹ ඇති බව ඔහුට දැනෙයි.

හැකි ඉක්මනින් රෝහලට යන්නට අනුරාධට අවශ්‍ය විය. හිතවතකුගේ කාරයක් ගෙන්වා ගන්නට වත් කාලය වැය නොකළ ඔහු දුරකතන ඇමතුමක් දී කුලී රියක් ගෙන්වා ගත්තේ ය.

පැයක් ඇතුළත නිෂාධිගේ රෝහල් කාමරය ඉදිරියේ සිටින්නට ඔහුට හැකි විය. ඔහු දොර අසළ නැවතී එබී බැලුවේ එකවරම ඇතුළට යන්නට නොහැකි බවක් දැනුණ බැවිනි. නිෂාධිගේ ඇඳ හිස් ව තිබෙණු ඔහු දුටුවේ ය. ඔහු කිහිළි කරු දෙකට සියළු බර දී අසරණව බලා සිටියේ ය.

''හදිස්සියෙම ලෙඩාගෙ ටිකට් කප්පවා ගෙන ගියා සර්..'' කාමරය සකස් කරමින් සිටි හෙදිය අනුරාධ දෙස බලා කීවා ය.
''ඇයි...?''

''දන්නෑ සර්... දැන් පැය බාගයක් ඇති ගිහින්..''

අනුරාධ ආපසු හැරුණේ දැඩි වේදනාවකිනි. වචනයෙන් කිව නොහැකි තරමේ අසරණ හැඟීමකින් ඔහු පෙළුණේ ය. ඔහු හඳුනා ගෙන ඔහු හා කතා කරන්නට පුල පුලා බලා සිටින බොහෝ මිනිසුන් ගැහැණුන් නොදුටුවා සේ අනුරාධ බා ගත් හිසින් රෝහලෙන් පිට වූයේ ය.

*මල් කැකුළ පිපෙන මුදු*
*සුමුදු පෙති විහිදාන*
*සුවඳ දී හැඩ රුවට*
*අරුණ පිණි බිඳු නාන*
*විළිබරයි හැඟුම් පොදි*
*ගැබ්බරව සඳපාන*
*මල් නෙළන්නේ කෝම*
*නටුව කටු පුරවාන...*

0000000000000

දිලීප නිෂාධි රෝහලෙන් ඉවත් කරවා ගත්තේ ඒ පිළිබඳව ඇගෙන් කිසිදු විමසීමක් නොකරමින් ය.

''අපි දැන් යනවා..'' යි ඔහු කියන තෙක්ම ඇය ඒ පිළිබඳව නොදැන සිටියා ය.

''කොහෙද..?'' ඇය ඇසුවේ විමතියෙනි.

''හොටෙල් එකට..'' ඔහු කීවේ ඇගේ ඇඳුම් පැළඳුම් සහ ආම්පන්න බෑගයට අසුරණ අතර ය.
''මේ හදිසියෙ...?''
''නැහැ.. හදිස්සියක් නැහැ.. මෙතන කාලෙ නාස්ති කරන්න ඕනෙ නැහැ.. දැන් ඔයාට ගෙදර යන්න පුලුවන් කියලා ඩොක්ටර්ස් ල කිව්වා.. අපි දැන් කෙළින්ම හොටෙල් එකට යනවා.. සෙනසුරාදා රෑ දොළහට අපි ෆ්ලයි කරනවා..''

''පිස්සු නටන්න එපා.. හෝටලේකට යන්න..? අම්මලා මොනා හිතයි ද..?''
''ඇයි ඒකෙ ඇති වැරැද්ද මොකක් ද..?''

''මට බැහැ.. මට ගෙදර යන්න ඕනෙ.. මට බැහැ හෝටල් ගානෙ ඉන්න.. ඔයාට ඕනෙ නම් හෝටලේ ඉන්න.. මං ගෙදර යනවා..''

දිලීප ඇය කී දේ නෑසුණා සේ බෑගය අතට ගත්තේ ය.

දිලීපයේ දරදඬු හැසිරීමට එරෙහි වන්නට තරම් ශක්තියක් තමාට නොමැති බවක් නිෂාධිට දැනුණි. ඔහුගේ මේ අමුතු හැසිරීම ඔහු කෙරෙහි ඇගේ සිතේ ගොඩ නැගෙමින් තිබූ අප්‍රසාදය තවත් වැඩි කරවන බව ඇයට දැනෙයි.

''පවිත්‍රට කිව්ව ද..?'' ඇය ඇසුවේ වාහනය අසළදී ය. ඔහු වාහනයේ පසුපස දොර ඇරගෙන ඇයට නගින්නට වාරු දෙමින් සිටියේ ය.
''පවිත්‍රලා දන්නව ද..?'' නිෂාධි නැවත ඇසුවා ය.



දිලීප ඇය දෙස හෙලුවේ දැඩි බැල්මකි.

''කාටවත් කියන්නවත් කාගෙන් අවසර ගන්නවත් මට අවශ්‍ය නැහැ...'' ඔහු ඉංග්‍රීසියෙන් කීවේ දොර මහ හඬින් වසා දමන අතර ය.

''අම්මලට කියන්න... ප්ලීස්...'' නිෂාධි ආයාචනා කළා ය. ඇගේ බිඳුණු හඬ ඔහු